# වැඩසටහන් හා කාර්ය සාධන වාර්තාව

# 2014

## හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අංක - 248 1/1, ගාලු පාර, කොළඹ - 04.

**නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

අංක -146, ගාලු පාර, කොළඹ - 03.

## අධ්‍යක්ෂකගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ හින්දු ආගම සහ හින්දු සංස්කෘතිය ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව 1986 ජනවාරි මස 1 වැනි දින පිහිටුවන ලදී. මෙම දෙපාර්තමේන්තුව දැනට නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයට අදාළ වාර්ෂික ගිණුම් හා ප්‍රගති වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී වචන කිහිපයක් එකතු කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම සතුටට පත්වෙමි. 2014 වර්ෂයේ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව මෙම දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වූ අරමුණු කාර්යක්ෂමව, ඵලදායී අන්දමට ඉටුකර ගැනීමට හැකිවූ බව ඉමහත් ආඩම්බරයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

අප දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය කාර්යක්ෂමව වර්ධනය කර ගැනීමට උරදුන් දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය සහ අළුතින් එක්වූ සංවර්ධන නිලධාරීන්ගේ උත්සාහය හා හෘදයාංගම කැපවීම ඉමහත් ශක්තියක් විය. දින 365 තුළ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සියල්ල සඳහන් කිරීම අපහසු කාර්යයක් බැවින් පාලන හා ගිණුම් ක්‍රියාවක් සාරාංශයක් වශයෙන් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

මා මෙම අවස්ථාවේදී මෙම කාර්යය සාර්ථකර ගැනීමට උරදුන් සියළුම අමාත්‍යවරුන්ටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ටත්, පළාත් සභා සාමාජිකයින්ටත්, සියළු රාජ්‍ය ආයතන වලටත්, හින්දු පූජ්‍ය හා පූජකවරුන්ටත්, හින්දු ආචාර්ය වරුන්ටත්, හින්දු සංගම් වලටත්, හින්දු කෝවිල් පාලක සභාවට සහ හින්දු දහම් පාසල්වල සියළු දෙනාටත් අප වෙත ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් කෘතඥතාව පළ කරමි.

තවද, අප දෙපාර්තමේන්තුවේ වගකීම් ඉතා සාර්ථක ලෙස ඉටුකර ගැනීමට බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ එම නිලධාරීන්ගෙන් ලැබූ සහාය ඉතා භාග්‍යයක් කොට සලකමි. එබැවින් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය මෙයින් ප්‍රකාශක සිටිමි.

2014 වර්ෂයේදී අපගේ ඉලක්කය වෙත ළඟාවීමට පූර්ණ සහාය ලබාදුන් මාගේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර නිළධාරීන්ට සහ අනෙකුත් නිලධාරීන්ට ද මාගේ ස්තූතිය ලබාදීම සුදුසු බව නිසැකයෙන්ම සඳහන් කරනු කැමැත්තෙමි.

**ශාන්ති නාවුකරසන්**
අධ්‍යක්ෂිකා

## හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**හැදින්වීම**

ශ්‍රී ලංකාවේ හින්දු ආගමික හා සංස්කෘතිය වැඩිදියුනු කිරීමේ අරමුනින් 1986.ජනවාරි 01 වැනි දින හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදි.

**දැක්ම**

හින්දු ආගම හා සංස්කෘතිය සුරැකීම හා මනා ලෙස පිහිටුවීම.

මෙහෙවර

හින්දු ආගම, හින්දු අධ්‍යාපනය, හින්දු සංස්කෘතිය හා කලාවන් සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්ත කිරීම හා හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම.

**අරමුණු**

- සිසුන් වෙනුවෙන් ආගමික වටිනාකම් සහ සදාචාරය වර්ධනය කිරීම සඳහා හින්දු ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
- හින්දු ආගමික කටයුතු ප්‍රවර්ධය හා හින්දු ආගමික ආවේනික සිරිත්විරිත් පවත්වාගෙන යෑම
- හින්දු ආගම හා සංස්කෘතිය පිළබදව පර්යේෂන ප්‍රවර්ධය කිරීම හා සංවර්ධනය කිරීම
- හින්දු ආගමික කලාව සහ ශිල්පීන් නිර්මාණය සඳහා පොදු ජනතාව අතර උසස් මතයක් ඇති කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

- හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය
- හින්දු පූජකවරුන් සඳහා පුහුණු සැපයීම
- හින්දු පූජකවරුන් සිහිපත් කිරීමේ අරමුණින් විශේෂ පූජාවන් පැවැත්වීම, හින්දු ආගමික දේශනා හා පාරම්පරික සම්ප්‍රධායන් ආරක්ෂා කිරීම.
- හින්දු අරනෙරි දහම් පාසැල්වල හින්දු ආගම ප්‍රවර්ධනය කිරීම හා ආගමික සාරධර්ම ප්‍රවර්ධනය කිරීම
- හින්දු විශ්වකෝෂය සංරක්ෂණය කිරීම
- හින්දු පර්යේෂන පුස්තකාල පාලනය
- හින්දු ආගමික හා සංස්කෘතික පර්යේෂනය
- හින්දු ආගමික කලාව හා දමිළ කලාව සංරක්ෂණය කිරීම
- කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ පාලනය
- මඩකලපුව හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පාලනය
- යාපනයේ ආනෛපන්දි කුරුකුලම් ගොඩනැගිල්ලේ කළමණාකරණය
- යාපනයේ නාවලර් මනි මණ්ඩපයේ පාලනය
- හින්දු කලාව හා සංස්කෘතිය සංරක්ෂණය කිරීම
- හින්දු සංස්කෘතික අරමුදල් පනත ක්‍රියාත්මක කිරීම

**කාර්ය සාධන වාර්තාව**
**2014.01.01 සිට 2014.12.31 දක්වා**

හැඳින්වීම

සාරධර්මයෙන් පිරි සමාජයක් ගොඩනැගීමට රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවන ලද වැඩසටහන්

**වැඩසටහන් සැලැස්ම**

I. හින්දු අරනෙරි දහම් පාසැල් ප්‍රවර්ධනය
II. හින්දු ආගම ප්‍රවර්ධනය කිරීම
III. හින්දු ආගමික සංස්කෘතික පර්යේෂණය
IV. හින්දු ආගම, දමිළ කලාව, සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම
V. හින්දු කෝවිල් හා හින්දු ආයතන සංවර්ධනය කිරීම

2014 දෙසැම්බර් මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුල දෙපාර්මේන්තුව මගින් පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කර ඇත.

## *I. හින්දු දහම් පාසැල් ප්‍රවර්ධනය*

හින්දු දහම් පාසැල් සිසුනගේ මනසේ සාරධර්ම, යහ ගුණාංග හා යහ පුරුදු වැඩිදියුණු කිරීම, දෙවියන්තුල විශ්වාසයෙන් යැදුම්පිදුම් කිරීමට මගපෙන්වීම, ආගමික දැණීම වර්ධනය කිරීමට අවශ්‍ය නිසි මාර්ගය පෙන්වාදීම අරමුණු කරගෙන හින්දු දහම් පාසැල් ක්‍රියාකරනු ඇත. මෙම ක්‍රියාවන් වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව මගින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි. ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම, අරනෙරි දහම් පාසැල් සඳහා පොත් ලබාදීම, සිසුන් සඳහා නිළඇඳුම් ලබාදීම, අරනෙරි දහම් පාසැල්වල යටිතල පහසුකම් සපුරාලීම සඳහා භාණ්ඩ ගෙන්වීමට ආධාර ලබාදීම ආදිය ව්‍යාපෘතින් මෙම අංශයේ ප්‍රධාන ව්‍යාපෘතින්ය.

### 01. අරනෙරි දහම්පාසැල් ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.

අරනෙරි දහම් පාසැල් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රමවේදය ක්‍රමවත් කිරීම, විෂය නිර්දේශවල යදනම පැහැදිලි කිරීමට, සිසුන්ට ප්‍රායෝගික අධ්‍යාපනය ලබාදීමටත් දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණු සම්මන්ත්‍රණ පවත්වනු ඇත.

**2014 දෙසැම්බර් මස 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ**

- ❖ ලියාපදිංචි කර ඇති දහම්පාසැල් සංඛ්‍යාව - 1,887
- ❖ අරනෙරි දහම්පාසැල් සිසුන් සංඛ්‍යාව - 285,067
- ❖ අරනෙරි දහම්පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව - 9,407

| # | වැඩසටහනේ නම | දිස්ත්‍රික්කය | ලාභීන් |
|---|---|---|---|
| 01. | ධර්මාචාර්ය නේවාසික පුහුණු 07ක් පවත්වා ඇත. | කොළඹ , ගම්පහ, ගාල්ල, කෑගල්ල, මාතලේ, කළුතර, පුත්තලම, කුරුණෑගල, මහනුවර, රත්නපුර, නුවරඑළිය, මාතර, බදුල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර, පොළොන්නරුව, යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, වවුනියාව | ධර්මාචාර්ය ගුරුවරුන් 707 දෙනෙකු ප්‍රයෝජනය ලබා ඇත. |
| 02. | ඉගෙන්වීම් පිළිබඳ පුහුණු පාඨමාලා 03ක් පවත්වා ඇත. | ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, පොළොන්නරුව, යාපනය | අරනෙරි දහම් පාසැල් ගුරුවරුන් 682 දෙනෙකු සහභාගී වී ඇත. |
| 03. | අරනෙරි ගුරුවරුන් සඳහා අවසාන වාර විභාග සම්මන්ත්‍රණ 13 ක් පවත්වා ඇත. | කළුතර, රත්නපුර, බදුල්ල, කොළඹ , ගම්පහ, කිලිනොච්චිය, මුලතිව්, ගාල්ල, මන්නාරම, මඩකලපුව, පුත්තලම, අම්පාර, යාපනය, මහනුවර | අරනෙරි දහම් පාසැල් ගුරුවරුන් 1196 දෙනෙකු සහභාගී වී ඇත. |





**ධර්මාචාර්ය නේවාසික සම්මන්ත්‍රණය - කොළඹ**






**ධර්මාචාර්ය ගුරුවරුනගේ නේවාසික සම්මන්ත්‍රණය මඩකලපුව**

## 02. අරනෙරි පාසැල් සිසුන් සඳහා සාමාන්‍ය දැනීම් විභාග පැවැත්වීම

දේශීය මට්ටමින් පවත්වන ලද හින්දු ආගමික සාමාන්‍ය දැනීම් විභාගය 2006 වර්ෂයේ සිට වාර්ෂිකව මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ඇත. 2 වසරේ සිට 11 වන වසර දක්වා ඉගෙනුම ලබන සිසු සිසුවියන්ගේ ආගමික දැණුම වර්ධනය කිරීම, ඇගයීම, පෞර්ෂ වර්ධනය ආදිය දියුණු කිරීමේ අරමුණින් පාසැල් විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සංවර්ධන නිළධාරින් යන අයගේ සහයෝගත්වයෙන් මෙම විභාගය පවත්වන ලදි.

මෙම විභාගයෙන් දේශීය මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් අති විශිෂ්ය ලෙස සමත්වූ සිසු සිසුවියන් වෙනුවෙන් මුදල් ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රධානය කරනු ලැබුවේය.

2014 ජුනි මස 28 වැන් දින දිවයින පුරා පවත්වනු ලැබූ විභාගය මධ්‍යස්ථාන 160 ක පවත්වන ලද මෙම විභාගය සඳහා  සිසුන් 69,783 දෙනෙකු සහභාගී වී ඇත. මෙම විභාගයේ විශිෂ්ය ලෙස සමත් වූ සිසුන් වෙනුවෙන් ත්‍යාග ප්‍රධානෝත්සවය 2014 ඔක්තෝබර් මස 18 වැනි දින බම්බලපිටිය නව කදිරේශන් ශාලාවේදි පැවැත්විය. මෙම උත්සවයේදි දේශීය මට්ටමින් පළමු ස්ථානය දිනාගත් සිසුන් 31 දෙනෙකුට, දෙවන ස්ථානය ලබාගත් සිසුන් 07 දෙනෙකුටත්, තෙවන ස්ථානය ලබාගත් සිසුන් 08 දෙනෙකුත් රු 5000/=, රු 4000/=, රු 3000 බැගින් මුදල් ත්‍යාගය හා සහතික ප්‍රධානය කලේය. තවද, දිස්ත්‍රික්ක මට්ටමින් පළමු ස්ථානය දිනාගත් සිසුන් 161 දෙනෙකුටත්, දෙවන ස්ථානය ලබාගත් සිසුන් 144 දෙනෙකුටත්, තෙවන ස්ථානය ලබාගත් සිසුන් 129 දෙනෙකුත් රු 3000/=, රු 2000/=, රු 1000 බැගින් මුදල් ත්‍යාගය හා සහතික ප්‍රධානය කරන ලදි. මෙම උත්සවයේ විශේෂ සගරාවක් එළිදක්වුයේය. මෙයට අරනෙරි දහම් පාසැල්වල ගුරුවරුන්, දෙමව්පියන්, සිසුන් ඇතුළුව 1000 දෙනෙකු පමණ සහභාගිවූහ.



**03. හින්දු අරනෙරි ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබාදීම**

අරනෙරි ගුරුවරුන්ගේ දැණීම වර්ධනය කිරීම සඳහා වාර්ෂිකව රු 2000/= පුස්තකාල දීමනාවක් ලබාදෙනු ඇත. මෙම වර්ෂයේද යාපනය, මඩකලපුව, මහනුවර, නුවරඑළිය, කිලිනොච්චිය, මුලතිව්, අම්පාර, කෑගල්ල, මාතලේ, බදුල්ල, පුත්තලම, ත්‍රිකුණාමලය, රත්නපුර, කළුතර, පොළොන්නරුව, කොළඹ, කුරුණෑගල, ගාල්ල, මාතර, ගම්පහ, මන්නාරම, වවුනියා ආදිය දිස්ත්‍රික්ක 22 ක දහම් පාසැල් 773ක සිටින ගුරුවරුන් 3250 දෙනෙකු සඳහා මෙම දීමනාව ලබාදී ඇත.

**04. සංගීත භාණ්ඩ මිලදී ගැනීම හා බෙදාදීම**

මෙම වර්ෂයේ දහම් පාසැල්වලට ලබාදීම සඳහා  සුරුදි පෙට්ටි 81ක් හා තාලම් 80 මිළදී ගෙන ඇත. එයින් රත්නපුර, කළුතර, ගාල්ල, යාපනය, මඩකලපුව, නුවරඑළිය, කිලිනොච්චි ආදිය දිස්ත්‍රික්ක පාසැල් 79ක් සඳහා බෙදා දී ඇත.

**05. අරනෙරි දහම් පාසැල් සිසුන් වෙනුවෙන් නිළ ඇඳුම් මිළදී ගැනීම හා බෙදාදීම**

මෙම දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව අරනෙරි දහම් පාසැල් සිසු සිසුවියන් සඳහා නොමිලේ නිළ ඇඳුම් ලබාදෙනු ලැබේ. එබැවින් වාරිකතුණක් ලෙස මීටර් 65,050 නිළ ඇඳුම් මිළදී ගෙන එයින් මහනුවර, මාතලේ, නුවරඑළිය, මඩකලපුව, කළුතර, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, බදුල්ල, කොළඹ, ගාල්ල, රත්නපුර යන දිස්ත්‍රික්ක 13කින් දහම් පාසැල් 311ක සිසුන් 10,968 දෙනෙකු සහ සිසුවියන් 11,889 දෙනෙකු සඳහාත් බෙදා දී ඇත.

**06. පන්නිසෙ පන්ති**

හින්දු අරනෙරි දහම් පාසැල් සිසුන්ගේ පන්නිසෙ ගැයීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව දිස්ත්‍රික්ක මට්ටමින් පන්ති පවත්වනු ඇත. මෙම වර්ෂයේ කළුතර, යාපනය, මඩකලපුව, බදුල්ල, ආදිය දිස්ත්‍රික්කවල පන්ති 437ක් පවත්වා ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ සිසුන් සඳහා පන්නිසෙ සම්මන්ත්‍රණයක් 20.12.2014 දින බුලත්සිංහලදි පවත්වා ඇත. බදුල්ල හා මඩකලපුව දිස්ත්‍රික්ක වල සිසුන් සඳහා පන්නිසෙ සම්මන්ත්‍රණයක් 20.12.2014 ලුණුගලදි පවත්වා ඇත. එයින් සිසුන් 200 කට අධික සංඛ්‍යාවක් සහභාගී වී ප්‍රයෝජනය ලබාගත්හ.

**පන්නිසෙ සම්මන්ත්‍රණය - කළුතර**

**07. අරනෙරි දහම් පාසැල් සඳහා ප්‍රාග්ධන වියදම්**

අරනෙරි දහම් පාසැල්වට අවශ්‍ය ගෘහ භාණ්ඩ (මේස, පුටු) ලබාදීමේ වැඩසටහන යටතේ මෙම දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව රු 30,000/= මුදලක් ලබාදෙනු ඇත. ඒ අනුව මෙම වර්ෂයේ මහනුවර, කෑගල්ල, කොළඹ, රත්නපුර, කිලිනොච්චි, මඩකලපුව, ත්‍රිකුණාමලය, යාපනය, වවුනියා, පුත්තලම, කළුතර, මුලතිව්, බදුල්ල, නුවරඑළිය, මාතලේ, කුරුණෑගල, ගාල්ල, පොළොන්නරුව ආදිය දිස්ත්‍රික්ක 18 ක දහම් පාසැල් 67 ක් සඳහා ආධාර ලබාදී ඇත.

**08. අරනෙරි දහම් පාසැල් සිසුන්ට සහාය සඳහා පහත සඳහන් පොත් මිළදි ගැනීම**

- හින්දු මක්කලුක්කු ඔරු කෛයේඩු - පිටපත් 1,000
- අරනෙරි අමුදම් - පිටපත් 4,000
- හින්දු නාගරීගම් - පිටපත් 500
- නට්චින්දනයි - පිටපත් 250
- ආලුමෛ වලර්ච්චි - පිටපත් 60
- නිත්තිය වලිපාට්ටු තෝත්තිරම් - පිටපත් 500
- සිරුවර්ගලුක්කාන සෛ සමය කදෛගල් - පිටපත් 200
- සිරුවර්ගලුක්කු සුවාමි විපුලානන්දර් - පිටපත් 200
- අරුල්වාක්කුගල් - පිටපත් 250
- මන්නිල් නල්ල වන්නම් අමුද මොලි - පිටපත් 250
- රාමක්‍රිෂ්ණරින් නීදි කදෛගල් - පිටපත් 25
- විපුලානන්දර් සොන්න කදෛගල් - පිටපත් 36
- ඉරෛඅරුල් අමුදම් - පිටපත් 200
- ඉලෛඥර්ගලින් සින්දනෛක්කු - පිටපත් 260
- වීර ඉලෛඥර්ගලුක්කු - පිටපත් 130
- සිත්තිර රාමායනම් - පිටපත් 109
- විවේගක් කිදෛගල් - පිටපත් 120
- මහාබාරදම් - පිටපත් 100

මිළදි ගන්නා ලද පොත් අරනෙරි දහම්පාසැල් සිසුන් වෙන බෙදාදී ඇත.

**09. අරනෙරි සිසුන් සඳහා පොත් සහ ලේඛණ මුද්‍රණය කිරීම හා බෙදාදීම**

අරනෙරි දහම් පාසැල්වල ගුරුවරුන්ට හා සිසුන්ට උපකාරයක් ලෙස පහත සඳහන් පොත් මිලදී ගෙන ඇත.

**මුද්‍රණය කරන ලද පොත්**

- අවසාන වාර විභාග ප්‍රශ්ණ පත්‍ර - පිටපත් 3,000
- සෛව පෝදිනි ( පහළ ශ්‍රේණිය) - පිටපත් 6,000
- සෛව පෝදිනි ( ප්‍රාථමික ශ්‍රේණිය) - පිටපත් 6,000
- සෛව පෝදිනි ( ඉහළ ශ්‍රේණිය) - පිටපත් 5,000
- සෛව සමයම් - පිටපත් 3,000
- හින්දු ධර්මාසිරියර් විනාවිඩෛ - පිටපත් 2,000
- අව්වයාර් අරිවුච් චෙල්වම් - පිටපත් 4,990
- ආසිරියර් කෛයේඩු - පිටපත් 6,000
- පැමිණීමේ ලේඛණ - පිටපත් 20,000
- ත්‍යාග ප්‍රධානෝත්සව උත්සවයේ සගරාව - පිටපත් 1,000
- විෂය නිර්දේශ - පිටපත් 5,000

**මුද්‍රණය කරන ලද පොත් අරනෙරි දහම් පාසැල් 460 ක් සඳහා බෙදා දී ඇත.**

- සෛව පෝදිනි ( පහළ ශ්‍රේණිය) - පිටපත් 5399
- සෛව පෝදිනි ( ප්‍රාථමික ශ්‍රේණිය) - පිටපත් 6000
- සෛව පෝදිනි ( ඉහළ ශ්‍රේණිය) - පිටපත් 5000
- සෛවසමයම් - පිටපත් 3000
- හින්දු ධර්මාසිරියර් ප්‍රශ්ණ පත්‍ර - පිටපත් 149

- ❖ අච්චයාර් අරිවුච් චෙල්වම් - පිටපත් 3838
- ❖ ආසිරියර් කෛයේඩු - පිටපත් 3944
- ❖ පැමිණීමේ ලේඛණ - පිටපත් 4076
- ❖ විෂය නිර්දේශ - පිටපත් 2898



**අරනෙරි දහම් පාසැල් සිසුන්ට ලබාදී ඇති පොත්**

**10. හින්දු තරුණ තරුණියන් වෙනුවෙන් ආධ්‍යාත්මික පුහුණු වැඩසටහන් පැවැත්වීම**

හින්දු තරුණ තරුණියන්ගේ ආධ්‍යාත්මික ගුණාංග හා නායකත්වය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව මෙම වැඩසටහන පවත්වනු ඇත. මෙම වර්ෂයේ අප්‍රේල් මස 19,20 දිනයන්හි බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කවල සිටින හින්දු තරුණ තරුණියන් වෙනුවෙන් බදුල්ලේදීත්, සැප්තැම්බර් මස 5,6 දිනයන්හි කිලිනෝච්චි දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් වෙනුවෙන් කිලිනොච්චිය හින්දු විද්‍යාලයේදි හා ඔක්තෝබර් මස මුලතිව්, වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කවල සිටින තරුණ තරුණියන් වෙනුවෙන් මාංගුලම් සිවසට්ගුණනාදර් ආශ්‍රමයේදි හා දෙසැම්බර් මස 22,23 දිනයන්හි කැගල්ල දිස්ත්‍රික්කයේ හින්දු අරනෙරි දහම් පාසැල් තරුණ තරුණියන් වෙනුවෙන් කොළඹ රාමක්‍රිෂ්ණ ශාලාවේදි පවත්වා ඇත. මෙම පුහුණුවට 527 දෙනෙකු සහභාගී විය.





කැගල්ල දිස්ත්‍රික්කයේ හින්දු තරුණ තරුණයන් වෙනුවෙන් කොළඹ රාමක්‍රිෂ්ණ ශාලාවේදි සම්මන්ත්‍රණය පැවැත්වූ අවස්ථාවේදි

**11. දැයට කිරුළ වැඩසටහන යටතේ දහම් පාසැල් ගොඩනැගිලි සෑදීම සඳහා ආධාර ලබාදීම.**

කැගල්ල, පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල දහම්පාසැල් ගොඩනැගිලි සෑදීමට ආධාර ලබාදී ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ පාසැල් - 03, කැගල්ල දිස්ත්‍රික්කයේ පාසැල් - 01, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසැල් - 01 බැගින් පාසැල් 05ක් සඳහා රු ලක්ෂ 2 බැගින් රු මිලි 1ක් අදාළ දිස්ත්‍රික් ලේකම් මගින් ලබාදී ඇත.

## *II. හින්දු ආගමික ප්‍රවර්ධනය*

හින්දු සංස්කෘතික හා ආගමික උත්සවයන් දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් දිස්ත්‍රික්කවල උත්සවයන් සංවිධානය කරනු ඇත.

### 12. හින්දු ආගමික දේශනා

කෝවිලවල හා හින්දු ආගමික ආයතනවල හින්දු ආගමික දේශකයින් විසින් මෙම දේශනා පවත්වනු ඇත. මෙතෙක් යාපනය, පුත්තලම, මඩකලපුව, රත්නපුර, මාතලේ, මහනුවර, අම්පාර, බදුල්ල, කොළඹ, නුවරඑළිය, මුලතිව්, කිලිනොච්චිය, කළුතර, ගාල්ල යන දිස්ත්‍රික්ක 14 ක දේශනා 12 ක් පවත්වා ඇත. එමගින් හින්දු පොදු ජනතාව 7500කට වැඩි පිරිසක් ප්‍රයෝජනය ලබා ඇත.





### 13. ගුරුපූජා

මියගොස් ඇති හින්දු ආගමික පූජකවරුන් සිහිපත් කරමින් කෝවිල්වල විශේෂ පූජාවන් පවත්වනු ඇත. මෙම වාර්ෂයේ යාපනය, කොළඹ, රත්නපුර, ගාල්ල, බදුල්ල, නුවරඑළිය, මුලතිව්, මහනුවර, ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව, මාතලේ, ගම්පහ, පුත්තලම, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 16 ක ගුරුපූජාවන් 90 සිදුකර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිළධාරින්ගේ සහයෝගයෙන් හින්දු ආගමික ආයතනවල අනුග්‍රහයෙන් මෙම පූජාවන් පවත්වන ලදි. මෙයින් 7200 දෙනෙකුට වැඩි පිරිසක් ප්‍රයෝජනය ලබා ඇත.






**14. හින්දු ආගමික උත්සවයන්**

**තෛ පොංගල් උත්සවය - තෛ පොංගල් විශේෂ මුද්දර එළිදැක්වීම**

2014.01.14 දින යාපනය නල්ලූර් දුර්කා මනි මණ්ඩපයේ තැපැල් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් තෛපොංගල් විශේෂ මුද්දරයක් එළිදක්වන ලදි.






**තෛ පොංගල් උත්සවය**

2014.01.14 වැනි දින යාපනය නාවලර් මනි මණ්ඩපයේ , වවුනියා, කිලිනොච්චිය, කළුතර, කොළඹ, නුවරඑළිය, පුත්තලම, .ත්‍රිකුණාමලය, මඩකලපුව යන දිස්ත්‍රික්කවල දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් පවත්වන ලදි.

**මහා ශිවරාත්‍රි උත්සවය**

දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් මෙම වර්ෂයේ මාර්තු මස 20 වැනි දින මහා ශිවරාත්‍රි උපවාසය නිමිත්තෙන් විශේෂ පූජාවන් හා ආධ්‍යාත්මික වැඩසටහන් රත්නපුර ශිවන් කෝවිලේදි පවත්වන ලදි. මෙම උත්සවය සඳහා බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමන්, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම්, දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඇතුළු ප්‍රධානීන් සහභාගී විය.

තවද, ශිවරාත්‍රී උත්සවය නිමිත්තෙන් මුලතිව්, ගාල්ල, යාපනය, පුත්තලම, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, කිලිනොච්චිය, පොලන්නරුව, යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති කෝවිල්වල විශේෂ පූජාවන් හා සංස්කෘතික වැඩසටහන්ද දෙපාර්තමේන්තුවේ අනුග්‍රාහයෙන් පවත්වන ලදි.









රත්නපුර ශිවන් කෝවිලේදි පවත්වන ලද
මහාශිවරාත්‍රි උත්සවය

### නවරාත්‍රි උත්සවය

දෙපාර්තමේන්තුවේ අනුග්‍රාහයෙන් සැප්තැම්බර් මස 24 වැනි දින සිට ඔක්තෝබර් මස 03 දින දක්වා යාපනය, මඩකලපුව, මහනුවර, නුවරඑළිය, කිලිනොච්චිය, මුලතිව්, අම්පාර, මාතලේ, බදුල්ල, පුත්තලම, ත්‍රිකුණාමලය, මාතර, රත්නපුර, කළුතර, පොලන්නරුව, කොළඹ, ගාල්ල, ගම්පහ, වවුනියා යන දිස්ත්‍රික්ක 09ක උත්සව 50ක් පැවැත්විය 2014.09.25 වැනි දින පාර්ලිමේන්තුවේ පැවැත්වූ උත්සවයේදි අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයේ නිළධාරින්ද සහභාගී විය. මෙම උත්සවයට යාපනය හා මුලතිව් දිස්ත්‍රික්කවල දහම් පාසැල් සිසුන්ගේ සංස්කෘතික අංගයන්ද පැවැත්වූහ.




කාරෙයිනගර් සිවගාමි අම්මන් කෝවිලේදි පවත්වන ලද නවරාත්‍රි උත්සවය



යාපනයේ ගුරුකුලම්හිදි පවත්වන ලද නවරාත්‍රි උත්සවය

### 15. පුන්‍යග්‍රාම වැඩසටහන

දුෂ්කර ප්‍රදේශවල තෝරාගන්නාලද ජනතාව එක්කොට සාරධර්මාත්මක වැඩසටහන් පවත්වනු ඇත. දැනට යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, ගාල්ල, බදුල්ල, වවුනියා, රත්නපුර ආදිය දිස්ත්‍රික්ක 09ක වැඩසටහන් 14 පවත්වා ඇත. මෙයට පාසැල් සිසුන් හා පොදු ජනතාව 2050 වැඩි පිරිසක් සහභාගී වී ප්‍රයෝජනය ලබාගෙන ඇත.




## 16. නල්ලූර් නාවලර් මනි මණ්ඩපයේ පවත්වන ලද පවත්වන පන්තීන්

දෙපාර්තමේන්තු පාලනය යටතේ ඇති නල්ලූර් නාවලර් මනි මණ්ඩපයේ අරනෙරි දහම් පාසැල් සිසුන්ගේ ශාරීර, මානසික හා සෞඛ්‍ය වර්ධන කිරීම සඳහා යෝගා පන්ති 174, මිරුදංගම් පන්ති 64, වයලින් පන්ති 75, පන්නිසෛ පන්ති 102ක් , ගුරුපූජා 03ක්, නවරාත්‍රි උත්සවය හා තිරුවාසග උත්සනවද පවත්වා ඇත.





## 17. මඩකලපුව හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පවත්වන ලද පන්තීන්

දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ ඇති මඩකලපුව හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ අරනෙරි පාසැල් සිසුන්ගේ ශරීර සෞඛ්‍ය හා කලාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා යෝගා පන්ති 54, නර්ථන පන්ති 430 ක් හා නවරාත්‍රි උත්සනයද පවත්වා ඇත.



## 18. දැයට කිරුළ ප්‍රදර්ශණය

2014 ජනවාරි 21 දින සිට 2014 පෙබරවාරි 02 වන දින දක්වා දැයට කිරුළ යන මාතෘකාව යටතේ ප්‍රදර්ශණයක් කුරුණෑගල වයඹ විශ්ව විද්‍යාලයේදි පැවැත්වි. මෙම ප්‍රදර්ශනයට සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහභාගී වී ප්‍රදර්ශණ කුටි සාදා තිබුනි. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට වෙන්කර තිබු ප්‍රදර්ශණ කුටියේ දෙපාර්තමේන්තු මගින් ක්‍රියාවට නංවන වැඩසටහන් පිළිබඳ වාර්තා, පින්තූරු, දෙපාර්තමේන්තුවෙන් එළිදක්වන ලද පොත් හා හින්දු පාරම්පරිකය සම්බන්ධ දෑ ප්‍රදර්ශනය කර තිබුනි.





## 19. වෙනත් උත්සවයන්

ශ්‍රී ලංකාවේ 66 වන නිදහස් දින නිමිත්තෙන් 2014.02.04 වන දින හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාරත්මේන්තුවේ ප්‍රධානත්වයෙන් කෑගල්ල, ශ්‍රී කදිර්වේලායුද ස්වාමි කෝවිලේදී විශේෂ පූජාවක් පවත්වන ලදි. එයට සබරගමුව පළාත් සභා මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශයේ අතිරේඛ ලේකම්, කෑගල්ල දිස්ත්‍රික් ලේකම්, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු දෙපාර්තමේන්තු නිළධාරින්ද සහභාගි විය.







නිදහස් උත්සව දිනයේ පවත්වන ගද විශේෂ පූජා - කෑගල්ල

පොලන්නරුව, බදුල්ල දිස්ත්‍රික්කවල පැවැත්වූ දමිළ සංස්කෘතික සංස්කෘතික දිනයට 365 වැඩි පිරිසක් සහභාගී විය





## 20. හින්දු පූජකවරුන්ට හා අරනෙරි දහම්පාසැල් ගුරුවරුන්ට වෙනත් භාෂා පුහුණුව ලබාදීම

හින්දු පූජකවරුන්ට හා අරනෙරි දහම්පාසැල් ගුරුවරුන්ට වෙනත් භාෂා පුහුණුව ලබාදීමේ අරමුනින් මෙම පුහුණුව මඩකපුව හා යාපනය දිස්ත්‍රික්කවල අගොස්තු මස ආරම්භ කරන ලදි. එබැවින් යාපනයේ සිංහල පන්ති 24ක් හා ඉංග්‍රීසි පන්ති 24 පවත්වා ඇත. මඩකලපුවේ සිංහල පන්ති 41ක් පවත්වා ඇත.

## 21. ''ඉනිය වසන්තම්'' හින්දු බෞද්ධ අයවළුන් සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන (අමාත්‍යාංශ ප්‍රතිපාදන)

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීමෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය සංවිධානය කරනු ඇත.

මෙම වැඩසටහන, හින්දු, බෞද්ධ ජනතාව අතර එකමුතුකම හා සංහිදියාව වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කර ඇත. මෙම වැඩසටහනට හින්දු, බෞද්ධ සිසුන්, ගුරුවරුන්, දෙමව්පියන්, ආගමික නායකයින්ද එක්කොට කරුණු පැහැදිලි කිරීමකින් ජාතීන් අතර සමගිය, කලාව, සංස්කෘතිය දැනැගැනීම සඳහා මගපෙන්වීමක් කරන වැඩසටහනකි.

**2014 වර්ෂයේ වැඩසටහන් 08ක් පවත්වා ඇත.**

01. 2014.05.03 දින සිට 2014.05.04 දින දක්වා මඩකලපුව කල්ලඩි හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්විය
02. 2014.05.31 දින සිට 2014.06.01 දින දක්වා පොලොන්නරුව, වැලිකන්ද, අසේලපුර මෛත්‍රී ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ පැවැත්විය.
03. 2014.06.20 දින සිට 2014.06.22 දින දක්වා යාපනයේ කෝප්පායි ක්‍රිස්තියානි විද්‍යාලයේදි පැවැත්විය.
04. 2014.07.26 දින සිට 2014.07.28 දින දක්වා පුත්තලම, මහව, ඉහළ ශ්‍රී සුදර්ශණාරාම විහාරස්ථානයේ පැවැත්විය.
05. 2014.08.2**3** දින සිට 2014.07.24 දින දක්වා වවුනියා බෝධිදක්ෂණාරාම විහාරස්ථානයේදි පැවැත්විය.
06. 2014.09.13 දින සිට 2014.09.14 දින දක්වා මන්නාරම තිරුකේදීශ්වරම් හි දි පැවැත්විය.
07. 2014.10.04 දින සිට 2014.10.05 දින දක්වා කිලිනොච්චිය මහාදේව ආශ්‍රමයේදි පැවැත්විය.
08. 2014.11.08 දින සිට 2014.11.09 දින දක්වා කුරුණෑගල කොකරැල්ල උතුරු පච්ච විහාරස්ථානයේදි පැවැත්විය.

මඩකලපුවේ පැවැති උත්සවයේදි .සිත්තිවිනායගර් අරනෙරි පාසැල, ශ්‍රී වීරයඩි විනායගර් අරනෙරි දහම් පාසැල, සිවශක්ති අරනෙරි දහම් පාසැල, ශ්‍රී නාලිංග වෛරවර් අරනෙරි දහම් පාසැල, ශ්‍රී මුත්තුමාරිඅම්මන් අරනෙරි දහම් පාසැල, විවේගානන්දා අරනෙරි දහම් පාසැල, බාරදියාර් අරනෙරි දහම් පාසැල්, යාපනයේ පැවැති වැඩසටහනට ශ්‍රී පරරාජ පිල්ලෙයාර් අරනෙරි දහම් පාසැල, සිවගාමි අරනෙරි දහම් පාසැල, ශ්‍රී සෙල්ව කදිර්ගාම මුරුගන් අරනෙරි දහම් පාසැල, නෙල්ලන්ඩයි අම්මන් අරනෙරි දහම් පාසැල, සිවත්තමිල් අරනෙරි දහම් පාසැල, සිවන් අරනෙරි දහම් පාසැල, ශ්‍රී මුත්තුමාරියම්මන් අරනෙරි දහම් පාසැල, පූම්පුගාර් සිත්ති විනායගර් අරනෙරි දහම් පාසැල, ශ්‍රී මුරුගන් අරනෙරි දහම් පාසැල, සිත්ති විනායගර් අරනෙරි දහම් පාසැල් හා කිලිනොච්චියේ පැවැති වැඩසටහනේ සිට්ටෘන්ඩි විනායගර් අරනෙරි දහම් පාසැල, අරුල්මිගු කන්දස්වාමි අරනෙරි දහම් පාසැල, සුවාමි විවේගානන්දර් අරනෙරි දහම් පාසැල, හා නාගපූසනි අම්මන් අරනෙරි දහම් පාසැල්ද සහභාගිවිය.





මඩකලපුවේ පැවැති ඉනිය වසන්දම් වැඩසටහන





කුරුණෑගල පැවැති ඉනිය වසන්දම්　　　පොලොන්නරුව පැවැති ඉනිය වසන්දම්

## *III. හින්දු ආගමික පර්යේෂණ*

### 22. හින්දු ආගමික පර්යේෂණ සම්මන්ත්‍රණ

දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන හින්දු ආගම පිළිබඳ සම්මන්ත්‍රණයේ එක් අංගයක් ලෙස මෙම වර්ෂයේ "තිරුවාදවූරරුම් සෛවත්තිරුනෙරියුම්" යන මාතෘකාව යටතේ ජූලි මස 18 වැනි දින සිට 20 වැනි දින දක්වා බම්බලපිටිය සරස්වති ශාලාවේපවත්වන ලදි.

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශාන්ති නාවුකරසන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම සම්මන්ත්‍රණෙය් ආරම්භ උත්සවය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර උපදේශක එස්. පත්මනාදන් මහතා සහභාගී වූයේය.

මෙම වැඩසටහන සඳහා මැලේෂියාවේ තිරුමුරුගන් තිරුවාක්කු තිරුපීඨයේ සභාපති අතිපූජ්‍ය බාලයෝගි ස්වාමින් වහන්සේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසත්, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එම්.කේ.බි. දිසානායක මහතා ගෞරව ආරාධික අමුත්තා ලෙසත් සහභාගි වූයේය.


සම්මන්ත්‍රණෙයේ දේශනා හා සංස්කෘතිය අංග ලෙස කොටස් දෙදකින් සමන්විතව පැවැත්වුයේය. මෙම දින තුන තුලදි දේශනා 12කින් රචනා 45ක් පර්යේෂණය සඳහා භාර දී තිබුනි. මෙයට මැලේෂියාවේ සිට පැමිණි මලායා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ආර්. සීදාලක්ෂ්මි මහත්මිය, මලායා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ආචාර්ය තිලකවති කනගරත්නම් යන අය සහභාගී වූ අතර, ඉන්දියාවේ සිට පැමිණි අන්නාමලෛයි විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය පලමුත්තු වීරප්පන් මහතා, කාමරාජර් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය වෙංගට්රාමන් මහතා, අභිලේඛණ විද්‍යාත්මක ආචාර්ය වී වේදාච්චලම් මහතා, තමිල්නාඩු සිට පැමිණි ලෝක දමිළ පර්යේක්ෂන ඒ. සදීශ් මහතා, තමිල්නාඩු සිට පැමිණි ලෝක දමිළ පර්යේක්ෂන ආචාර්ය එස්. තසරදන් මහතා, ලෝක දමිළ පර්යේක්ෂන සම්මේලනයේ කේ. සිවකුමාර් මහතා සහභාගී විය. තවද තිරුතනිගෛ සුවාමිනාදන් මහතාගේ පන්නිසෛ සංගීත උළෙලක් හා ශ්‍රිමති නල්ලකන්නු මහත්මියගේ නර්ථන කණ්ඩායම වන මලේෂිය පත්මාලයා නර්ථන කණ්ඩායමේ නර්ථන අංගයන්ද පැවැත්විය.













සම්මන්ත්‍රණයේ දෙවන දිනයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය දි.මු ජයරත්න මැතිතුමන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අවස්ථාවේ සම්මන්ත්‍රණ පොත හා සීඩී තැටියද එළිදැක්වුයේය. මෙම දින තුනේදිම විශ්වවිද්‍යාල සිසුන්, පාසැල් සිසුන්ද හා හින්දු භක්තිකයින් 200 ක්ද සහභාගි විය.









**සම්මන්ත්‍රණ අවස්ථාවේ හින්දු කලයි කලන්ජියම් (12 වන අධියර) පොත හා තිරුවාසග කවි අඩංගු සීඩී තැටි එළිදැක්වීම.**


පසුගිය වර්ෂයේ පවත්වන ලද සම්මන්ත්‍රණවල ලබාදුන් රචනා වන මූවර් තමිලුම් සෛව තිරුනෙරියුම් පොත, හින්දු විශ්ව කෝෂය 12 වන වෙළුම හා තිරුවාසග කවි අඩංගු සීඩී තැටියද එළිදැක්වූයේය.

මූවර් තමිලුම් සෛව තිරු නෙරියුම් යන පොත පිටු 644 කින් හා රචනා 40 කින් යුත්තව පිටපත් 750 ක් මුද්‍රණය කර තිබුනි.

සම්මන්ත්‍රණයේ ආරම්භක උත්සවයේදි මෙම වර්ෂයේ මාතෘකාවට අදාළව තිරුවාදවූරරුම් සෛවතිරුනෙරියුම් යන මාතෘකාවෙන් විශේශිත පොතේ පිටපත් 1000ක් මුද්‍රණය කර සම්මන්ත්‍රණයට සහභාගී වූ අයවළුන්ට නොමිලේ බෙදා දෙන ලදි. මෙය රචනා 10කින් යුක්ත පිටු 182කින් සාදා තිබුනි.








**අළුත්අවුරුදු ලිත, ගෝපුරම්, පන්පාඩු පොත් එළිදැක්වීම**

දෙපාර්තමේන්තු තෙරතුරු ඇතුළත්කර එළිදක්වන කෝපුරම් යන පොතෙහි පළමු හා දෙනව පිටපතේ, පිටපත් 3000 ක් හා පන්පාඩු යන පොතෙහි පිටපත් 1000 මුද්‍රනය කර පොදු ජනතාවට හා කෝවිල්වලට බෙදා දී ඇත.

හින්දු ලිතෙහි පිටපත් 12,000 ක් මුද්‍රණය කර පොදු ජනතාවට හා කෝවිල් වලට බෙදා දී ඇත. පිල්ලයාර් කදෙෙ පොතේ පිටපත් 4000 ක් මුද්‍රණය කර බෙදා දී ඇත. කියවීම් මාසය නිමිත්තෙන් වර්ග 15කින් යුත් පොත් කට්ටල දේශීය මට්ටමින් පිහිටා ඇති පාසැල් 150කට හා පොදු පුස්තකාල සඳහා ලබාදී ඇත.








**23. සංස්කෘත පන්ති පැවැත්වීම**

මාස තුනක කාලයක් පවත්වන ලද මෙම පන්ති යාපනයේ හා කොළඹදි ආරම්භ කරන ලදි. කොළඹින් සිසුන් 25 දෙනෙකු සමග පන්ති 28ක් හා යාපනයේ සිසුන් 12 දෙනෙකු සමග පන්ති 29ක් පවත්වා ඇත.



මෙම පන්තිවල සහතික ප්‍රධානෝත්සවය 2014.06.21 වැනි දින දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ හා 2014.06.29 වැනි දින යාපනය ගුරුකුලම් හිදීත් පවත්වන ලදි. මෙම උත්සවය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශාන්ති නාවුකරසන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනේය. පුහුණුව ලබගත් සිසුන් සහතික ලබාගත්තේය.





**24. ශෛව සිද්ධාන්ත පන්ති**

ශෛන සිද්ධාන්තය පිළබඳ දැනගැනිමට උන්නදුවෙන් සිටින අයවළුන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව මගින් සැලසුම් කර පවත්වාගෙන යන ලදි. මෙම වර්ෂයේ අප්‍රේල් මස 04, 05 දිනවල ත්‍රිකුණාමලය උවර්මලෙයි විවේගානන්දා විද්‍යාලයේ පැවැත්වුනා. මෙයර පාසැල් ගුරුවරුන්, සිසුන්ගේ ඉල්ලීමක් පරිදි පාසැල්වල හින්දු ශිෂ්ඨාචාරය ඉගෙනුම ලබන ළමුන් සඳහා මෙම පන්ති පනත්වන ලදිත මෙයට 350කට අධික පිරිසක් සහභාගී වූහ.

**25. පර්යේෂණ රුස්වීම් හා සාකච්ඡා**

හින්දු කලෛයිකලන්ජියම් 12 වන වෙළුම හා දුර්ලභසණයේ පොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ සභිකයින්ගේ කණ්ඩායම මෙතෙක් සාකච්ඡා 08ක් පවත්වා ඇත.

**26. ශිල්ප හා වාස්තු විද්‍යාව පිළිබඳ සම්මන්ත්‍රණ**

කෝවිල්වල ගොඩනැගිලි, ශිල්ප හා වාස්තු පිළිබඳ නේවාසික සම්මන්ත්‍රණයක් 2014 ජූලි මස 01,02 දිනවල වවුනියාවේදීත්, 03,04 දිනවල කිලිනොච්චියේදීත්, 05, 06 දිනවල මුලතිව්හිදීත් සම්මන්ත්‍රණ 03ක් පවත්වා ඇත. මෙයට උසස්පෙළ සිසුන් හා උසස්පෙළ උගන්වන ගුරුවරුන්ද වවුනියාවේදි 250දෙනෙකු, තිලිනොච්චියේ දි 175 දෙනෙකු හා මුලතිව්හිදි 175 දෙනෙකුද සහභාගී විය.

මෙම සම්මන්ත්‍රණයේ දේශනා සඳහා ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස විෂය උපදේශක ආචාර්ය සි.පද්මනාදන් මහතා හා ඉන්දියාවේ සිට පැමිණි පුරාවිද්‍යා දේශක වේදාචලම් මහතාද දේශනය පැවැත්විය.

**27. රාජ්‍ය පාසැල්වල හින්දු ආගම උගන්වන ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම**

රාජ්‍ය පාසැල්වල හින්දු ආගම උගන්වන ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණයක් 2014.09.15 දින සිට 2014.09.17 දක්වා රත්නපුර, ගාල්ල, කෑගල්ල, මාතර, කොළඹ, කළුතර දිස්ත්‍රික්කවල පවත්වන ලද සම්මන්ත්‍රණයේ ගුරුවරුන් 80 දෙනෙකු වැඩි පිරිසක් සහභාගීවූහ.

**28. ප්‍රසිද්ධ කෝවිල්වල නාම ලේඛණය හා තොරතුරු ඇතුළත් පොත නිර්මාණය කිරීම**

ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ප්‍රසිද්ධ කෝවිල්වල විශේෂත්වයන් හා ඉතිහාසය සඳහන් කර විශේෂ අත් පොතක් විදේශ හා ස්වදේශ භක්තිකයින්ගේ පහසුව සඳහා සකස් කිරීමට තීරණය කර ඇත. මෙතෙක් තොරතුරු ලැබී ඇති කෝවිල් වල යාපනය, මුලතිව්, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය ආදිය දිස්ත්‍රික්කවල ඇති කෝවිල් හා වෙනත් ප්‍රසිද්ධ කොවිල් 76ක් තෝරාගෙන රචනා ලියමින් සිටි. ඒ සමග යාපනයේ පිහිටා ඇති ප්‍රසිද්ධ කෝවිල් 10 ක පින්තූරු ලබාගෙන ඇත.

## 29. ශ්‍රී ලංකා වචන අඩංගු ශබ්දකෝෂ

ශ්‍රී ලංකාවේ භාවිතයේ තිබෙන දමිළ වචන එක්කොට ශබ්දකෝෂයක් නිර්මාණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. දැනට පරිඝණක කර ඇති වචන 1300ක් මුද්‍රණය සඳහා ලබාදී ඇත.

# *III. හින්දු දමිළ කලාව, සංස්කෘතික ප්‍රවර්ධනය*

## 30. ශ්‍රී ලාංකික කතෘවරුන්ගෙගන් පොත් මිලදී ගැනීම

ශ්‍රී ලාංකික දමිළ කතෘවරුන් දිරිමත් කිරීමේ අරමුනින් මෙතෙක් කතෘවරුන් 70 දෙනෙකුගෙන් පොත් 1825ක් මිලදිගෙන පුස්.නාලවලට බෙදාදෙන ලදි.

## 31. ගැමි කලාව ප්‍රවර්ධනය කිරීම

දමිළ කලාව ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගැමි කලාව පිලිබඳ සම්මන්ත්‍රණයක් ඔක්කෝබර් මස 10,11,12 දින වල මඩකලපුව, නාවට්කුඩා හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්විය. එම සම්මන්ත්‍රණයට මඩකලපුව, යාපනය, අම්පාර, මධ්‍යම පළාතේ සිට කලාකරුවක් 150 දෙනෙකු පමණ සහභාගිවූහ.





## 32. කලාභූෂණ රාජ්‍ය සම්මාන උළෙල

දමිළ කාලවට හා සංස්කෘතියට ඉමහත් සේවාවක් කරන කලාකරුවන් සඳහා වාර්ෂිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය උසස් සම්මානයක් වන කලාභූෂණ සම්මානය පිරිනමනු ඇත. මෙම සම්මානය ලබාගැනීමට සුදුසු දමිළ කලාකරුවන් දෙපාර්තමේන්තුව මගින් තෝරාපත් කර ඇති තේරීම් කමිටුවක් විසින් කලාකරුවන් 100 දෙනෙකු තෝරාගනු ලැබේ.
මෙම රාජ්‍ය සම්මනෙ උළෙල 2014 දෙසරම්බර් මස 14 වැනි දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි පැවැත්වුනේය. මෙහිදි සිංහල කලාකරුවන් 278 දෙනෙකුටත්, දමිළ කලාකරුවන් 100 දෙනෙකුටත්, මුස්ලිම් කලාකරුවන් 78 දෙනෙකුටත් සම්මාන ප්‍රධානය කරන ලදි. මෙයට කලාකරුවන් 1000 දෙනෙකු පමණ සහභාගීවූහ.









## *IV. හින්දු කෝවිල් හා ආයතන ප්‍රවර්ධනය*

**ප්‍රාග්ධන විදම් යටතේ හින්දු කෝවිල් වලට ආධාර ලබාදීම**

**33. හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම (උතුර, නැගෙනහිර)**

හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ උතුර, නැගෙනහිර පළාත්වල කෝවිල් 363 ක් සඳහා ප්‍රා දේශීය ලේකම් මගින් රු ලක්ෂයක බැගින් චෙක්පතක් මගින් ලබාදී ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | යාපනය | 118 |
| 02. | මඩකලපුව | 125 |
| 03. | අම්පාර | 21 |
| 04. | ත්‍රිකුණාමලය | 40 |
| 05. | වවුනියා | 38 |
| 06. | මන්නාරම | 21 |
| | **එකතුව** | **363** |



ශ්‍රී පුවනේෂ්වරි අම්බාල් කෝවිල - තෙල්ලිපලයි



ශ්‍රී බත්ත්‍රකාලියම්මන් කෝවිල - තන්නාමුනයි, මඩකලපුව



ශ්‍රීමත් නාරායනන් කෝවිල - අම්පාර



සිත්තිවිනායගර් කෝවිල - පූනගරි

**34.** **හින්දු කොවිල් හා ආයතනවල ප්‍රතිසංස්කරණය**

හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා මෙතෙක් උතුර නැගෙනහිර පළාත් හැර අනෙකුත් දිස්ත්‍රික්කවල කෝවිල් 146 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් මගින් රු ලක්ෂය බැගින් මුදලක් චෙක්පතකින් ලබාදී ඇත. මෙම ශිර්ෂය යටතේ දැයට කිරුළ ව්‍යාපෘතියෙන් කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්කවල කෝවිල් 43 සඳහා ප්‍රාදේශීය ලේකම් හරහා රු මිලි 5.4 වෙන් කර ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | බදුල්ල | 19 |
| 02. | කොළඹ | 10 |
| 03. | ගාල්ල | 13 |
| 04. | කළුතර | 08 |
| 05. | මහනුවර | 19 |
| 06. | කුරුණෑගල | 02 |
| 07. | මාතලේ | 04 |
| 08. | මාතර | 04 |
| 09. | නුවරඑළිය | 27 |
| 10. | රත්නපුර | 40 |
| **එකතුව** | | **146** |
| **දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ** | | |
| 11. | කුරුණෑගල | 29 |
| 12. | පුත්තලම | 25 |
| **එකතුව** | | **189** |



ශ්‍රී කදිර්වේලායුද ස්වාමි කෝවිල- රොක්කතැන්න, හාලිඇල, නුවරඑළිය



ශ්‍රී කට්පහ පිල්ලයාර් කෝවිල තෙල්පැත්තවත්ත - බදුල්ල



ශ්‍රී සුබ්‍රමණියර් කෝවිල රෙවන් සුට් ඩිවිෂන්, බල්ලේකැටුව, බදුල්ල

## 35. දැයට කිරුළ ප්‍රදර්ශණය නිමිත්තෙන් කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා ආධාර ලබාදීම

මෙම වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශණය නිමිත්තෙන් පුත්තලම, කෑගල්ල දිස්ත්‍රික්කවල කෝවිල් 30 ක ප්‍රතිසංස්කරණය සඳහා දිස්ත්‍රික් ලේකම් මගින් වෙන් කර ඇති ආධාර මුදලින් කෝවිල් 28ක් ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | කෑගල්ල | 25 |
| 02. | පුත්තලම | 03 |
| **එකතුව** | | **28** |

## 36. උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ කෝවිලවලට ආධාර ලබාදීම

මෙම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් කෝවිල් 100ක් සඳහා රු ලක්ෂ 2ක බැගින් මූල්‍යාධාර ලෙස ප්‍රාදේශීය ලේකම් හරහා ලබාදී ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | කිලිනොච්චිය | 48 |
| 02. | මුලතිව් | 30 |
| 03. | මන්නාරම | 20 |
| 04. | යාපනය | 01 |
| 05. | වවුනියා | 01 |
| **එකතුව** | | **100** |



සිත්තිරමේනි වෛරවර් කෝවිල - යාපනය



සෙල්ව විනායගර් කෝවිල - ඕළුමඩු, මාංගුලම්



දුර්කා පරමේෂ්වර් නයිනෙ නාගම්මාල් කෝවිල
තිරුමුරුගන්ඩි



ශ්‍රී ශප්ත කන්නිමාර් කෝවිල වට්ටුවාගල්, මුලතිව්

**37. හින්දු කෝවිල්වල යටිතල පහසුකම්**

දිවයින පුරා පිහිටා ඇති කෝවිල්වල යටිතල පහසුකම් සපුරාලීම සඳහා කෝවිල් 79ක් සඳහා ආධාර ලබාදී ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | කිලිනොච්චිය | 19 |
| 02. | පුත්තලම | 01 |
| 03. | අම්පාර | 11 |
| 04. | මඩකලපුව | 06 |
| 05. | යාපනය | 15 |
| 06. | මන්නාරම | 07 |
| 07. | ත්‍රිකුණාමලය | 08 |
| 08. | වවුනියාව | 01 |
| 09. | මොණරාගල | 01 |
| 10. | පොළොන්නරුව | 05 |
| 11. | මහනුවර | 02 |
| 12. | රත්නපුර | 02 |
| 13. | කොළඹ | 01 |
| **එකතුව** | | **79** |



ශ්‍රී මානික්ක පිල්ලෙයාර් කෝවිලේ පිහිටා ඇති ජල ළිඳ - කිරාන්, මඩකලපුව



ශ්‍රී මුත්තුමාරිඅම්මන් කෝවිලේ පිහිටා ඇති ජල ටැංකිය- පරප්පු කඩන්දාන්, මන්නාරම



ඊලත්තු කාසි ශ්‍රේත්‍ර කෝවිලේ පිහිටා ඇති ජල ළිඳ - කිලිනොච්චිය

**ප්‍රාග්ධන වියදම යටතේ කෝවිල්වලට ආධාර ලබාදීම**

38. හින්දු කෝවිල්වලට කුම්භාබිෂේක යන විශේශ උත්සවයට ආධාර දීමේ ව්‍යාපෘතිය යටතේ කෝවිල් 13 ක් සඳහා ආධාර ලබාදී ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | යාපනය | 05 |
| 02. | බදුල්ල | 02 |
| 03. | නුවරඑළිය | 04 |
| 04. | පුත්තලම | 02 |
| 05. | කෑගල්ල | 03 |
| 06. | මුලතිව් | 01 |
| 07. | මන්නාරම | 01 |
| 08. | මහනුවර | 01 |
| 09. | රත්නපුර | 01 |
| 10. | අම්පාර | 01 |
| 11. | කොළඹ | 01 |
| **එකතුව** | | **22** |





ශ්‍රී මුත්තුමාරියම්මන් කෝවිලේ කුම්භාබිෂේක පූජාව හා චෙක්පත් ලබාදීම - පුණ්ඩළඔය





තිම්ලයි කන්නගි අම්මන් කෝවිල් කුම්භාබිෂේක උත්සවය - හලාවත


39. **හින්දු ළමා හා වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම**

හින්දු ළමා හා වැඩිහිටි නිවාස රැකබලාගත්නා අයවළුන්ගේ සේවය ඇගයීමක් ලෙස වාර්ෂිකව ලබාදෙනු ලබන ආධාර මෙම වර්ෂයේ පහත සඳහන් දිස්ත්‍රික්කවල තෝරාගන්නා ලද ළමා හා වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදී ඇත.

| # | දිස්ත්‍රික්කය | කෝවිල් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | මඩකලපුව | 08 |
| 02. | මාතලේ | 01 |
| 03. | කොළඹ | 01 |
| 04. | අම්පාර | 03 |
| 05. | මුලතිව් | 03 |
| 06. | යාපනය | 02 |
| 07. | වවුනියා | 03 |
| 08. | මන්නාරම | 01 |
| 09. | ත්‍රිකුණාමලය | 04 |
| 10. | කිලිනොච්චි | 02 |
| **එකතුව** | | **28** |



මුලතිව් - බාරදී ළමා නිවාස



අන්බු ළමා නිවාස - මුත්තෛයන්කට්ටු

**හින්දු ආයතන සඳහා ආධාර ලබාදීම**

හින්දු ආගමික ආයතන ප්‍රතිසංස්කරණය කිරීමට ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ මෙතෙක් මඩකලපුව ශ්‍රී සත්‍ය සායි සේවා ආයතනයේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් හා අම්පාර සිට කතරගම දක්වා පාදයාත්‍රාව සඳහාත්ආධාර ලබාදී ඇත.

## 40. නන්දිකොඩි මුද්‍රණය කිරීම හා බෙදාහැරීම


වාර්ෂිකව දෙපාර්තමේන්තුව මගින් හින්දු කෝවිල් හා ආයතන සඳහා නන්දි කොඩි මුද්‍රණය කර බෙදාහරිනු ලැබේ.

ඒ අනුව මෙම වර්ෂයේ බෙදාදී ඇති කොඩිවල විස්තර පහත සදහන් පරිදි

| # | නන්දි කොඩිවල තොරතුරු | කොඩිවල මුළු සංඛ්‍යාව | මුද්‍රණය කරන ලද මුළු කොඩි සංඛ්‍යාව | බෙදාදී ඇති කොඩි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලොකු කොඩි 43'x30' | 2518 | 2518 | 2260 |
| 02 | පොඩි කොඩි 9' x 11' (කුන්ජම් තබන ලද) | 3720 | 3720 | 2236 |
| 03 | පොඩි කොඩි 9' x 11' (ත්‍රිකෝණ හැඩැති) | 5485 | 5485 | 3680 |
| 04 | එල්ලෙන කොඩි 6' x2' ( දෙපස නන්දි රූව පිහිටන ලද) | 272 | 272 | 251 |
| එකතුව | | **11,995** | **11,995** | **8424** |

**හින්දු ආගමික කෝවිල්වල පරිපාලනය වෙනුවෙන් නිර්මාණය කරන ලද මගපෙන්වීම් අත්පොත**

හින්දු කෝවිල්වල පරිපාලනයට අවශ්‍ය සාධක හා බාදකයන් පිළිබද අවශ්‍ය දැණුම ලබාදීමට හා මගපෙන්වීමක් ලෙස පොදු නිතිරීති ඇතුළත් සංගරාවක් 2014 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව මගින් එළිදක්වනු ලැබුණි. මෙම පොතෙහි සදහන් කර ඇති දෑ කෝවිලවල හා කෝවිල පරිපාලන සභාවන් පුනර්ජීවනයක් ලබාදීමේ අපේක්ෂාවෙන් දෙපාර්තමේන්තුව මගින් මෙම පොත එළිදක්වා ඇත.




## හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
## මූල්‍ය ප්‍රගතිය 2014.01.01 සිට 2014.12.31 දක්වා

| | මූල්‍ය ප්‍රතිපාදන 2014 (රු මිලි) | මූල්‍ය ප්‍රගතිය (රු මිලි) | % |
|---|---|---|---|
| මූල්‍ය | 94.15 | 93.89 | 99.73 |
| පුනරාවර්ධන | 120.66 | 118.29 | 98.03 |
| **එකතුව** | **214.81** | **212.18** | **98.78** |

## අංශ වශයෙන් මූල්‍ය ප්‍රගති වාර්තාව 2014

| # | අංශ | මූල්‍ය ප්‍රතිපාදන 2014 රු මිලි | මූල්‍ය පුණරාවර්තනය රු මිලි | % |
|---|---|---|---|---|
| I | හින්දු අරනෙරි දහම් පාසැල් ප්‍රවර්ධනය | 31.72 | 31.70 | 99.93 |
| II | හින්දු ආගමික ප්‍රවර්ධනය | 3.34 | 3.28 | 98.20 |
| III | හින්දු සංස්කෘතික ප්‍රවර්ධනය | 6.60 | 6.59 | 99.84 |
| IV | හින්දු ආගම, දමිළ කලාව ප්‍රවර්ධනය | 2.50 | 2.45 | 98.00 |
| V | හින්දු කෝවිල් හා ආයතනවල ප්‍රවර්ධනය | 92.90 | 92.66 | 99.74 |
| | **එකතුව** | **137.04** | **136.68** | **99.73** |




දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති කෝවිල්, ආයතන හා හිනදු අරනෙරි දහම් පාසැල්

**(2014.12.31 දින දක්වා)**

| # | දිස්ත්‍රික්කය | හින්දු කෝවිල් හා ආයතන | | හින්දු අරනෙරි දහම් පාසැල් | | |
|---|---|---|---|---|---|---|
| | | කෝවිල් | ආයතන | දහම් පාසැල් | ගුරුවරුන් | සිසුන් |
| 01. | අනුරාධපුර | 08 | 01 | 01 | 05 | 363 |
| 02. | බදුල්ල | 321 | 67 | 167 | 999 | 16,542 |
| 03. | කොළඹ | 189 | 163 | 92 | 803 | 10,430 |
| 04. | ගාල්ල | 18 | 01 | 08 | 346 | 12 |
| 05. | ගම්පහ | 20 | 21 | 12 | 42 | 2,055 |
| 06. | හම්බන්තොට | 01 | 00 | 00 | - | - |
| 07. | කළුතර | 111 | 17 | 54 | 192 | 1,150 |
| 08. | මහනුවර | 320 | 73 | 145 | 258 | 19,538 |
| 09. | කෑගල්ල | 220 | 21 | 82 | 218 | 4,542 |
| 10. | කුරුණෑගල | 34 | 09 | 09 | 34 | 143 |
| 11. | මාතලේ | 98 | 15 | 54 | 194 | 7,261 |
| 12. | මාතර | 19 | 04 | 14 | 31 | 653 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13. | මොණරාගල | 24 | 06 | 05 | 15 | 121 |
| 14. | නුවරඑළිය | 589 | 115 | 141 | 542 | 13,530 |
| 15. | පුත්තලම | 68 | 36 | 45 | 198 | 2,534 |
| 16. | පොලන්නරුව | 11 | 06 | 06 | 23 | 968 |
| 17. | රත්නපුර | 235 | 37 | 107 | 307 | 12,085 |
| 18. | අම්පාර | 192 | 111 | 114 | 946 | 16,933 |
| 19. | මඩකලපුව | 862 | 306 | 219 | 1,495 | 128,466 |
| 20. | යාපනය | 1526 | 313 | 245 | 1099 | 17,830 |
| 21. | කිලිනොච්චිය | 200 | 19 | 69 | 192 | 5369 |
| 22. | මුලතිව් | 233 | 15 | 47 | 251 | 4,604 |
| 23. | මන්නාරම | 118 | 37 | 72 | 258 | 855 |
| 24. | ත්‍රිකුණාමලය | 279 | 82 | 108 | 608 | 12,926 |
| 25. | වවුනියා | 352 | 33 | 71 | 415 | 5,823 |
| | එකතුව | **6,048** | **1,508** | **1,887** | **9,407** | **285,067** |

**අනුමත කාර්යමණ්ඩය (2014.01.01 දින සිට 2014.12.31 දක්වා)**

| # | තනතුර | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ | 01 | 0 |
| 2. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ප.සේ) | 01 | 0 |
| 3. | ගණකාධිකාරි | 01 | 0 |
| 4. | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ප.සේ) | 00 | 01 |
| 5. | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ප.සේ නොවන) | 02 | 0 |
| 6. | පරිපාලන නිළධාරි | 01* | 00 |
| 7. | පුස්තකාලාධිපති | 01 | 0 |
| 8. | පර්යේෂණ නිළධාරි | 01 | 0 |
| 9. | සංවර්ධන සහකාර | 16 | 0 |
| 10. | සංවර්ධන නිළධාරි | 74 | 37 |
| 11. | සංස්කෘතික නිළධාරි | 02 | 0 |
| 12. | රාජ්‍ය කළමණාකරන සහකාර | 16 | 05 |
| 13. | හින්දු විශ්‍රාම ශාලා කළමණාකරු | 01 | 0 |
| 14. | හින්දු විශ්‍රාම ශාලා සහකාර කළමණාකරු | 01 | 0 |
| 15. | රියදුරු | 03 | 0 |
| 16. | හින්දු සංස්කෘතික සහකාර | 02 | 0 |

| | | | |
|---|---|---|---|
| 17. | දන්ත ඇතුළත් කිරීමේ නිළධාරි | 00 | 01 |
| 18. | සංස්කෘතික සේවක | 03 | 0 |
| 19. | කා.ක.ස | 06 | 02 |
| 20. | ආරක්ෂක නිළධාරි (විශ්‍රාම ශාලාව, කතරගම) | 01 | 0 |
| 21. | මුරකරු | 03 | 01 |
| 22. | කාමර භාරකරු (විශ්‍රාම ශාලාව, කතරගම) | 01 | 04 |
| | | **137** | **51** |

*ස්ථිර නොවන සේවයේ

## *හින්දු සංස්කෘතික අරමුදල*

### 2014 වර්ෂයට කාර්ය සාධන වාර්තාව

**හැදින්වීම**

හින්දු සංස්කෘතික අරමුදල 1985 වර්ෂ 31 වැනි ව්‍යවස්ථා අංකය පරිදි හින්දු ආගමික හා සංස්කෘතික කරුණු පැහැදිලි කිරීම සඳහා ආරම්භ කරන ලදි. මෙහි ස්ථිර සේවකයින් 03 දෙනෙකු හා ගරු අමාත්‍යතුමන් විසින් පත්කරනු ලබන 05 දෙනෙකු ඇතුළත්ව කණ්ඩායමක් ක්‍රියාකරයි. 2014 වර්ෂයේ පමත සඳහන් අය මෙම අරමුදල සඳහා නියෝජිතයන් ලෙස පත්කර ඇත.

**සභාපති**

එම්.කේ.බී. දිසානායක මහතා - ලේකම්, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය

**ප්‍රධාන පරිපාලන නිළධාරි**

ශාන්ති නාවුකරසන් මහත්මිය - අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ගණකාධිකාරි**

එම්.ජී. කාන්ඩීබන් මහතා - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**කාරක සභාව**

01. ම. සන්මුගනාදන් මහතා - සහකාර අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
02. එස්.ධනපාල මහතා
03. එස්. මන්මදරාජන් මහතා
04. ආර්.සිවකුමාර් මහතා
05. එම්.කදිර්ගාමන් මහතා

**මූල්‍ය තත්ත්වය**

- ලංකා බැංකුවේ 2014.12.31 දිනට ජංගම ගිණුමෙහි ඉතිරිය ලෙස රු මිලි 0.925 ඉතිරි ලෙස දන්වා ඇත.
- ලංකා බැංකුවේ 2014.12.31 දිනට ස්ථාවර තැම්පත් ගිණුමෙහි ඉතිරිය ලෙස රු මිලි 20.514 ඉතිරි ලෙස දන්වා ඇත.


## හින්දු සංස්කෘතික අරමුදල - ප්‍රගති 2014


| ව්‍යාපෘතින් | ප්‍රතිපාදන 2014 (රු මිලි) | 2014.01.01 දින සිට 2014.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 01. හින්දු කෝවිල් හා ආයතන සඳහා ආධාර ලබාදීම | 0.300 | 0.300 | 01. අරනෙරි දහම් පාසැල් ගොඩනැගිල් සඳහා ආධාර (පොලන්නරුව ඌව්ට්‍රඩි පිල්ලයාර් කෝවිලේ ගොඩනැගිල්ල සඳහා ආධාර) |
| 02. කෝවිලේ ඇතිකරන හරකා සඳහා ආධාර | 0.060 | 0.060 | 02. නගුලේෂ්වරම් කෝවිලේ ඇතිකරන හරකා වෙනුවෙන් ආධාර |
| 03. හින්දු අරනෙරි ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් | 1.20 | 1.12 | 03. නිළඇඳුම් රෙදි (සිසුන්ට හා ගුරුවරුන්ට) 1129 ගෙන්වා ඇත |

## හින්දු විශ්වකෝෂය.


හින්දු ආගමිකයින්ගේ හින්දු භක්තියටින්ගේ විශේෂ දිනයන්, හින්දු ඉතිහාසය, දර්ශණ විද්‍යාව, සංස්කෘතිය, හින්දු ආගමික නායකයින්, පිළබද වටිනා දැනුමක් ලබාදෙන පර්යේක්ෂණ රචනා හින්දු විශ්ව කෝෂයේ 12 වන වෙළුම නිකුත් කර ඇත. සකස් කොට ඇත. මෙම ව්‍යාපෘතිය 1989 වර්ෂයේ ආරම්භ කර 2014 වර්ෂයේ අවසාන කර ඇත. විස්තර පහත හැදින්වේ.


| හින්දු කලයි කලන්ජිය අධියරය | එළිදක්වන ලද වර්ෂය | රචනා සංඛ්‍යාව | අකුරු |
|---|---|---|---|
| I. | 1990 | 670 | ' අ - ඊ' |
| II. | 1992 | 400 | 'උ - අව්' |
| III. | 1996 | 149 | ' ක ' |
| IV. | 1996 | 172 | 'කා - කෟ' |
| V. | 2000 | 111 | 'ස - සා' |
| VI. | 2003 | 111 | 'සි - සෟ' |
| VII. | 2005 | 205 | 'ඥා - ති' |
| VIII. | 2006 | 160 | 'ති - තෝ' |
| IX. | 2007 | 130 | 'න - නෟ' |
| X. | 2009 | 150 | 'ප - පෞ' |
| XI. | 2011 | 137 | 'ම - මෟ' |
| XII. | 2014 | 117 | 'ය, ක්ෂ, ර, ල, ශ, ස, ශ්‍රී, හ,ව - වෟ' |



අධියරය I



අධියරය II



අධියරය III


අධියරය IV


අධියරය V



අධියරය VI


අධියරය VI



අධියරය VIII




අධියරය IX



අධියරය X



අධියරය XI



අධියරය XII

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් එළිදක්වන ලද මෙම හින්දු විශ්ව කෝෂයෙහි 12 වන වෙළුම යන පොත මුළු ලොව පුරාවටම රැස්කරන ලද හින්දු ආගමික තොරතුරු ඇතුළත් කර එළිදක්වනු ලබන එකම පොතකි. ලොවපුරා ජීවත්වන සියළුම දමිළ හින්දු ජනතාවට ප්‍රයෝජනයක් වන සකස් කර ඇති ලේඛණයක් බැවින් අප දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් මැලේෂියාවේ තිරුමුරුගන් තිරුවාක්කු ආයතනයේ සභාපති අතිපූජ්‍ය බාලයෝගි ස්වාමින් වහන්සේ විසින් මෙම විශ්ව කෝෂය වෙළුම් 12 ක් නැවත මුද්‍රණය කිරීමට එතුමන්ගේ සහයෝගය ලබාදීමට කැමැත්ත ප්‍රකාශකර ඇති අතර, එය 2015 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතය.

## හින්දු අරනෙරි දහම් පාසැල් සිසුන්ගේ විෂය නිර්දේශ ප්‍රතිනිර්මාණය කිරීම

රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම් අනුව 1989 වර්ෂයේ අරනෙරි දහම්පාසැල් ආරම්භකරන ලදි. ආලයම්තෝරුම් අරනෙරි පාඨසාලෛ යන තේමාව යටතේ කෝවිල්වලට අනුයුක්තව අරනෙරි දහම්පාසැල් ආරම්භ කරන ලදි. මේ සඳහා අරනෙරි විශය නිර්දේශ පොත් මුද්‍රණය කරන ලදි.

ඒ අනුව 2014 වර්ෂ අවසානයේදි විෂය නිර්දේශ ප්‍රතිනාර්මාණය කර වන දේවල් ඇතුළත්කොට විනය, සාරධර්මය, ධර්මය ආදියට ප්‍රමුඛතාවය දීමේ අරමුනින් පළමු වසරේ සිට පස වසර දක්වා ප්‍රතිනිර්මාණය කිරීමට ක්‍රියාකරමින් ඇත.

මේ සඳහා දෙපාර්තමේන්තු ආයෝජන කමිටුවක් පිහිටුවා එම අය විසින් ප්‍රතිනිර්මාණය කටයුකතු සිදු වෙමින් පවතිය. මෙහි පළමු අධියරය ලෙස පළමු වසර සිට පහ වසර දක්වා විෂයයන් ප්‍රතිනිර්මාණය අවසන් වී විෂය පොත් නිර්මාණය කර මුද්‍රණය වෙමින් පවතිය. එය නිවැරදි බලා 2015 වර්ෂයේ ජූනි මස එළිදැක්වීමට තීරණය කර ඇත.